www.kalaya.org

# වැටීම හා නැටීම

අර්නස්ට් මාක් විද්වතා බටහිර ඉන්ද්‍රියානුභූතවාදයෙහි හෙවත් යථානුභූතවාදයෙහි (positivism) පුරෝගාමියකු ලෙස සැලකෙයි. ඔහු කියා සිටි වැදගත් කරුණක් වූයේ බටහිර භෞතිකා විද්‍යාව ඉන්ද්‍රිය ගෝචර සංකල්පවලින් පමණක් විස්තර කළයුතු බව ය. ඔහු ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයට මෙන් ම පරමාණුවලට ද විරුද්ධ විය. එමෙන් ම ඔහු නිව්ටෝනීය අවස්ථිති සමුද්දේශ රාමුව ද (inertial frame of reference) භෞතික විද්‍යාවේ යොදාගන්නා සංකල්පයක් ලෙස ගතහොත් ප්‍රතික්ෂෙප කෙළේ ය. එයට හේතුව ඒ එකක්වත් පංචේන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කළ නොහැකි වීම ය. එහෙත් බටහිර භෞතික විද්‍යාඥයෝ ඒ එකක්වත් ප්‍රතික්ෂෙප නො කරති.

මාක් විද්වතා පරමාණුව ප්‍රතික්ෂෙප කෙළේ භෞතික විද්‍යා සංකල්පයක් ලෙස ය. ඔහු පරමාණුවේ පැවැත්ම ප්‍රතික්ෂෙප කළ බවක් ඉන් නො කියැවෙයි. අද වන විට පරමාණුව ඇතැයි පිළිගැනෙනවා පමණක් නොව ඒ බටහිර විද්‍යාවේ සංසිද්ධි තේරුම්කරන සංකල්පයක් ලෙස ද සැලකෙයි. එසේ වුවත් අද වන තුරු ද කිසිවකු පරමාණුවක් දුටු බවට (පරමාණුවක් පංචේන්ද්‍රියයන් මගින් ග්‍රහණය කළ බවට) සාක්ෂියක් නැත. එහෙත් සක් දෙවිඳු නැත් ද යන්න ඇසූ පමණින් යථාර්ථවාදීහු, හේතුවාදිහු (බුද්ධිවාදීහු) පරළ වෙති.

පවතින්නේ කුමක් ද (ජීවත්වන්නේ කවුද යන්න එහි ප්‍රාණවාචී ස්වරූපය වෙයි. ජීවත්වීම පැවතීමට වඩා සංකීර්ණ වන බව ද ඒ සමග කිවයුතු ය. ජීවත්වීම සඳහා පැවතීම අනිවාර්ය වෙයි. එහෙත් ප්‍රමාණවත් නො වෙයි) යන්න ඇතැමුන්ට සුළු ප්‍රශ්නයක් විය හැකි ය. එහෙත් එය දර්ශනයෙහි ඇති වැදගත් ම ප්‍රශ්නය වෙයි. බටහිර දර්ශනය පවතින්නේ කුමක් ද යන්න පවතින්න පිළිබඳ දැනුමෙන් වෙන්කර සැලකුව ද ඒ එසේ කළහැකි නො වෙයි. පවතින්නේ කුමක් ද යනු දැනගැනීම ඒ පිළිබඳ දැනුමක් මිස වෙනත් දෙයක් නො වෙයි. සත්භාවවේදය (ontology) ඥානවිභාගයෙන් (epistemology) වෙන්කළ හැකි නො වෙයි.

අහසේ වළාකුළු පවතින්නේ (පා වෙන්නේ) යැයි අපි කියමු. එමෙන් ම කඳු මුදුන් පවතින්නේ යැයි අපි කියමු. ඇතැම් වළාකුළු කඳු මුදුන්වල ගැටෙන්නේ යැයි ද අපි කියමු. වළාකුළ කඳු මුදුනේ ගැටෙන බව කඳු මුදුන හෝ වළාකුළ දන්නේ ද? කඳු මුදුනට සාපේක්ෂව වළාකුළ හෝ වළාකුළට සාපේක්ෂව කඳු මුදුන හෝ පවතී ද? ඊනියා යථාර්ථවාදියකු පවසනු ඇත්තේ කඳු මුදුන දැනගත්තත් නැතත් වළාකුළ පවතින බවත් එසේ ම වළාකුළ දැනගත්තත් නැතත් කඳු මුදුන පවතින බවත් ය. එමෙන් ම තව දුරටත් ඔහු කියනු ඇත්තේ වළාකුළ දැනගත්තත් නැතත් වළාකුළ පවතින බවත් කඳුමුදුන දැනගත්තත් නැතත් කඳු මුදුන පවතින බවත් ය.

බටහිර දර්ශනය පැවතීම, ඒ පිළිබඳ දැනුමෙන් වෙන් කරන්නේ එපරිද්දෙනි. ආරම්භයේ දී ම සත්භාවය ඥානවිභාගයෙන් වෙන්කරන්නේ පැවැත්මට එලෙස දැනුමෙන් තොර වාස්තවිකත්වයක්, යථාර්ථයක් ආරෝපණය කිරීමෙනි. මෙය උපකල්පනයක් පමණක් ම වෙයි. දැනුමෙන් තොර පැවැත්මක් ඇතැයි පිළිගන්නේ කුමක් මත පදනම් වී ද? මේ පිළිගැනීමට කිසිම පදනමක් නැත. එහෙත් බටහිර දර්ශනයෙහි ඒ බවක් නො කියැවෙයි. පවතින බව දන්නේ කෙසේ ද? බටහිර දර්ශනය ඒ ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් නො දෙයි. බටහිර දර්ශනයෙහි භෞතිකවාදී හෙවත් ද්‍රව්‍යවාදී (materialist) ප්‍රවණතාවට සත්භාවය ඥානවිභාගයෙන් වෙන්කිරීම එලෙස ප්‍රයෝජනවත් වෙයි.

බටහිර දර්ශනයෙහි විඥානවාදී ප්‍රවණතාවට ද ඒ වෙන්කිරීම ප්‍රයෝජනවත් වෙයි. සත්භාවය ඥානවිභාගයෙන් වෙන්කළ පසු ප්‍රශ්නය වනුයේ ඒ දෙකෙන් කුමක් ප්‍රධාන වේ ද යන්න ය. පැහැදිලිව ම සත්භාවය ප්‍රධාන කොට සලකන්නන්ට පැවැත්ම දැනුමෙන් ස්වායත්ත යැයි ගෙන පැවැත්මට ඊනියා වාස්තවිකත්වයක් ආරෝපණය කළ හැකි ය. එසේ සලකන්නෝ ද්‍රව්‍යවාදීහු වෙති. අනෙක් අතට සත්භාවයට වඩා ඥානවිභාගය ප්‍රධාන කිරීමෙන් වෙනත් දෙයක පැවැත්මකින් තොර දැනුමක් ගැන කතාකළ හැකි ය. ඔවුහු පැවැත්ම යන්න දැනුමට, එනම් දැනුම ලබන්නාට යටත්කරති. දැනුම ලබන්නා යනු මෙහි දී මනස වෙයි. බටහිර විඥානවාදය මෙන් ම ද්‍රව්‍යවාදය ද උපත ලබන්නේ සත්භාවය ඥානවිභාගයෙන් වෙන්කිරීමෙනි.

© Prof. Nalin De Silva

දෙකාරතේ (Descartes) විද්වතාගේ “මම සිතමි. එබැවින් මම වෙමි ” (I think therefore I am) යන සුප්‍රසිද්ධ ප්‍රකාශයෙහි පදනමෙහි ඇත්තේ ඥානවිභාගය සත්භාවයට වඩා ප්‍රධාන ලෙස ගැනීම ය. මම යන තැනැත්තා වුව ද පවතින්නේ ඒ තැනැත්තා සිතන බැවිනි. මගේ පැවැත්ම මගේ සිතීමට යටත්වෙයි. පැහැදිලිව ම මනස මෙහි දී ප්‍රධාන වෙයි. අපේ දර්ශනයෙහි අපි සත්භාවය ඥානවිභාගයෙන් වෙන් නො කරමු. යමක් පවතින්නේ ය යනු ඒ පැවතීම පිළිබඳ දැනුම මිස අනෙකක් නො වෙයි. ඒ දැනුම කිසිවකුට සාපේක්ෂ ය. යමක් පිළිබඳ යමකුට සාපේක්ෂ වූ දැනුමක් මිස වෙනත් වාස්තවික දැනුමක් හෝ දැනුමකින් තොර පැවැත්මක් හෝ නැත. ඒ උපකල්පනයක් නො වෙයි. දැනුම ගැන අපට වෙනත් ආකාරයකින් දැනුමක් ලබාගත නො හැකි ය.

වාස්තවික දැනුමක් ඇතැයි පවසන්නා එසේ කරන්නේ ඔහුගෙන් ස්වායත්ත ව නො වෙයි. දැනුම යන්නෙපි දන්නා බව යන්න ගම්‍ය වෙයි. ඉංගිරිසියෙන් නොලෙජ් (knowledge) කීවද එහි ද කාහට වූ දැනුමක් (to know) යන්න ගම්‍ය වෙයි. වාස්තවික දැනුමක් ඇතැයි යන්න ද ඒ කියන තැනැත්තාට සාපේක්ෂ වෙයි. කිනම් සත්භාවයක් ගැන කතාකළ ද ඒ අවසානයේ දී යම්කිසි අයකුට සාපේක්ෂවූ සත්භාවයක් (පැවැත්මක් වෙයි). යමකුට තමාගෙන් තොර දැනුමක් ඇතැයි පැවතීමට අවශ්‍ය නම් ඒ තමාගෙන් තොරව පැවසිය යුතු ය. තමාගෙන් තොරව යමක් පවසන්නේ කෙසේ දැයි තමාගෙන් තොරව පැහැදිලි කළ හැකි කිසිවෙක් වෙත් ද?

සත්භාවවේදය හා ඥානවිභාගය එකිනෙකින් වෙන්කළ නොහැකි යැයි ගත්විට මේ අවුල් පැන නොනගී. යමක් පවතින්නේ ය යනු ඒ පිළිබඳ (කාගේ හෝ) දැනුමක් මිස කිසිවකුගෙන් ස්වායත්ත වූ පැවැත්මක් නො වෙයි. කඳු මුදුනෙහි ගැටෙන වළාකුළ පිළිබඳ දැනුමක් ඇත්තේ අපට ය. අලියකු ඒ කෙසේ දකී දැයි අපි නො දනිමු. කන්දට හෝ වළාකුළට ඒ පිළිබඳ කිසිම දැනුමක් තිබිය නො හැකි ය. මෙහි දී කිසිවකුට මෙවැනි ප්‍රශ්නයක් ඇසිය හැකි ය. පොල් ගෙඩියක් පොළොවට වැටෙන්නේ ගුරුත්වාකර්ෂණය නිසා නම් පොල් ගෙඩියට ගුරුත්වාකර්ෂණය නො දැනෙන්නේ ද?

ගුරුත්වාකර්ෂණය යන්න පොල් ගෙඩියට තබා අපටවත් දැනගැනීමට නොහැක්කේ ගුරුත්වාකර්ෂණයක් නොමැති බැවිනි. ඒ බව අයින්ස්ටයින් විද්වතා ම පවසා ඇත. පොල් ගෙඩියට ගුරුත්වාකර්ෂණය නොදැනෙන්නේ නම් ඒ පොළොවට වැටෙන්නේ කෙසේ දැයි කිසිවකුට ඇසිය හැකි ය. අයින්ස්ටයින් විද්වතා කියනු ඇත්තේ පොල් ගෙඩිය අවකාශ කාලයෙහි භූමිතිකයක් (geodesic) දිගේ චලනය වන බව ය. එවිට තවත් ප්‍රශ්නයක් ඇසිය හැකි ය. පොල් ගෙඩිය භූමිතිකයක් දිගේ චලනය විය යුතු බව පොල් ගෙඩිය දන්නේ කෙසේ ද?

පොල් ගෙඩිය පසෙකින් තබමු. උඩකින් අත්හැරියහොත් අප ද භූමිතික දිගේ චලනය වන්නේ අප ඒ බව දැනගෙන ද? පොල් වැටෙන්නාක් මෙන් අප ද වැටෙයි. ඒ වාක්‍යයෙහි ව්‍යාකරණ වැරදි යැයි යමකුට සිතෙන්නට පුළුවන. එය අපි වැටෙමු ලෙස නිවැරදි විය යුතු යැයි සිතෙන්නට පුළුවන. එහෙත් අපි වැටෙමු යන්න අපි නටමු යන ආකාරයේ ක්‍රියාවක් නො වෙයි. අප නටන්නේ අපට අවශ්‍ය නිසා ය. අප නැටවෙන අවස්ථා ද තිබිය හැකි මුත් සාමාන්‍යයෙන් අප නටන්නේ සවිඥානිකව ය. එහෙත් උසකින් වැටෙන විට අපට වැටීම පිළිබඳ සවිඥානික විය හැකි වුවත් අප වැටෙන්නේ හිතා මතා නො වෙයි. නටයි යන්න සප්‍රාණවාචී ක්‍රියාවක් වන අතර වැටෙයි යන්න අප්‍රාණවාචී ක්‍රියාවක් වෙයි. මල් පොල් හා අප ද වැටෙයි. එහෙත් අපි නටමු. මල් හා පොල් කවියකුගේ මනසෙහි මිස නො නටයි.

මෙහි දී අපි වැදගත් කරුණක් සඳහන් කරන්නෙමු. අප හිතා මතා නොවැටුණත් අපට ඒ පිළිබඳ දැනුමක් ඇත. වෙනත් ආකාරයකින් කියන්නේ නම් අප වැටෙන බව අපි දනිමු. එහෙත් පොල් ගෙඩිය හිතා මතා නොවැටෙනවා පමණක් නොව එයට එහි වැටීම ගැන දැනුමක් පවා නැත. එසේ නම් පොල් ගෙඩිය වැටෙන්නේ කෙසේ ද? පොල් ගෙඩිය වැටෙන්නේ කෙසේ ද යන්නට එයට දිය හැකි පිළිතුරක් නැත. නැට්ටෙන් ගිලිහුණු විගස ඒ වැටෙයි. එපමණකි. එහෙත් පොල් ගෙඩිය ඒ බවවත් නො දනියි. එනම් ඒ නටුවෙන් ගිලිහුණු බවවත් වැටෙන බවවත් පොල් ගෙඩිය නො දනියි. ඒ සියළු දැනුම් ඇත්තේ පොල් ගෙඩියට නොව අපට ය. පොල් ගෙඩිය නටඑවෙන් ගිලි හී වැටෙන බව අපි දනිමු. අවශ්‍ය නම් තවත් ඔබ්බට ගොස් පොල් ගෙඩිය ගුරුත්වාකර්ෂණය නිසා නටුවෙන් ගිලිහීමෙන් පසු පොළොවට වැටෙන බව අපි කියමු.

© Prof. Nalin De Silva

පොල් ගෙඩියට ඒ වටෙන බව පිළිබඳ ව තබා ඒ පොල් ගෙඩියක් ය යන්න පිළිබඳවවත් දැනුමක් නැත. පොල් ගෙඩිය පොල් ගෙඩියක් බව දන්නේ අප ය. අලියකු ඒ ගැන කුමක් කියන්නේ දැයි අපි නො දනිමු. එහෙත් අලියාට පොල් ගෙඩිය පිළිබඳවත් එහි වැටීම පිළිබඳවත් යමක් කිවහැකි, එනම් අඩු තරමින් චිත්ත රූපයක් මවාගත හැකි බව අපට කිවහැකි ය. චිත්ත රූප ඇතිකර ගැනීමට භාෂාවක් අවශ්‍ය නොවන බව ළදරුවන් නිරීක්ෂණය කිරීමෙන් දත හැකි ය.

ඇතැම් කුඩා දරුවන් හරිහැටි භාෂාවක් කතාකිරීමට පෙර ම සන්නිවේදනය කරනු ඔබ දැක ඇතැයි සිතමි. අනෙක් අයට වාඩිවීමට යැයි කීමට ඇතැම් දරුවෝ ඒ බව පොළොවට අතින් ගසා අභිනයෙන් කියති. එහෙත් එයටත් වඩා ඇතැම් දරුවෝ තමන් භාෂාවක් කරිහැටි කතානොකරන කාලයේ සිදු වූ අත්දැකීමක් පසුව භාෂාවක් යම් ප්‍රමාණයකට ඉගෙන අවශ්‍ය සංකල්ප දැනගැනීමෙන් පසුව වචනයෙන් ප්‍රකාශ කරති. දරුවන් තමන් භාෂාවක් යම් ප්‍රමාණයකට කතාකිරීමට ඉගෙන ගන්නාතෙක් ඒ අත්දැකීම දැනගෙන තිබුණේ කෙසේ ද? ඒ දරුවන්ට ඒ පිළිබඳ දැනුමක් තිබුණා පමණක් නොව එහි ස්මරණයක් ද තිබී ඇත. නැතහොත් භාෂාවක් කතාකිරීමට යම් තරමකින් දැනගත් පසු ඒ අත්දැකීම ප්‍රකාශ කළ නො හැකි ය.

මේ සියල්ලෙන් කියැවෙන්නේ දැනුමට යම්කිසි පුද්ගලයකුගේ ඇති සම්බන්ධය පමණක් නො වෙයි. දැනුම ඒ පුද්ගලයාගේ දැනුමක් බව ද පැහැදිලි වෙයි. එයට වචන හා භාෂාවක් තිබීම අනිවාර්ය නො වෙයි. වචනවලින් දැනගැනීම හා සන්නිවේදනය පහසු කෙරෙයි. එහෙත් ඇතැම් අවස්ථාවල වචනවල හිරවූ පසු දැනගැනීමට බාධා ඇති කෙරෙන බව ද පැහැදිලි ය. ඒ කුමක් වුවත් මනසක් ඇති සත්වයන් පමණක් දැනුමක් ඇතිකරගන්නා බව පැහැදිලි විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva